**ශීර්ෂය - 325 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 325 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ දී ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් පරිත්‍යාග කර තිබූ නෞකාවක සහ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයෙන් (UNODC) පරිත්‍යාග කර දළ තක්සේරු වටිනාකම රු.73,981,670 ක්වූ බෝට්ටුවක් ද ඕස්ට්‍රේලියානු වෙරළ ආරක්ෂක බලකාය විසින් පරිත්‍යාග කර තිබුණු රු.27,881,944 ක් වටිනා යන්ත්‍රෝපකරණ මූල්‍ය නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණු අතර එය හෙළිදරව් කිරීමටද කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට නාවික හමුදාව විසින් ලබා දි ඇති නෞකාවේ වර්ථමාන වටිනාකම දළ වශයෙන් රු. 29,736,000 ක් වන අතර UNODC මඟින් පරිත්‍යාග කරන ලද යාත්‍රාවේ වටිනාකම දළ වශයෙන් රු. 44,245,670 කි.<br><br>ඕස්ට්‍රේලියානු වෙරළ ආරක්ෂක බළකාය විසින් පරිත්‍යාග කර තිබූ යන්ත්‍රවල වටිනාකම රු. 27,881,944 ක් වන අතර එය මූල්‍ය නොවන වත්කම් වශයෙන් මූල්‍ය ප්‍රකාශණ වලට ඇතුලත් විය යුතුය. | පරිත්‍යාග වශයෙන් ලද මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කළ යුතුය. |

(ආ) අග්‍රිම ශේෂය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ දැක්වෙන සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාරයට පියවූ රු. 22,991,500 ක මුදල අග්‍රිම ගිණුම පිළිබඳ ප්‍රකාශයේ මුදල් මඟින් අග්‍රිම පියවීමක් ලෙස දක්වා නොතිබුණි. එමෙන්ම භාණ්ඩාගාරයේ ශේෂ පිරික්සුමට අනුව වියදම් මඟින් අග්‍රිම පියවීම් වටිනාකම රු. 318,812,087 ක් වුවද මුදල් මඟින් පියවූ වටිනාකමද වියදම් මඟින් පියවීමක් ලෙස දක්වා තිබීමෙන් අග්‍රිම ගිණුම පිළිබඳ ප්‍රකාශයේ එම වටිනාකම රු. 341,803,586 ක් විය. ඒ අනුව එම ශේෂයන් අතර රු. 22,991,500 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙය මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදි සිදුවූ යම් අතපසුවීමක් බැව් නිරීක්ෂණය වන අතර, ඉදිරි මූල්‍ය ප්‍රකාශනයන්හිදි මුදල් සහ වියදම් මඟින් භාණ්ඩාගාරය වෙත සිදුකරන අග්‍රිම පියවීම් වෙන්වෙන් වශයෙන් දැක්වීමට සටහන් කර ගන්නා ලදී. | මුදල් සහ වියදම් මඟින් අග්‍රිම පියවීම් වෙන වෙනම සටහන් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ ඉන්ධන සඳහා වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු. 2,400,000 ක් වූ අතර තත්‍යය මුළු වියදම රු. 582,759,746 ක් විය. ඒ අනුව ඇස්තමේන්තුවට වඩා ඉන්ධන වියදම රු. 580,359,746 ක් එනම් සියයට 24,180 කින් වැඩි වී තිබූ අතර ඇස්තමේන්තු ප්‍රමාණවත් නොවීම මත අතිරේක ඉන්ධන ප්‍රතිපූර්ණය | දෙපාර්තමේන්තුවේ දෛනික ඉන්ධන අවශ්‍යතාවය වෙනුවෙන් අයවැය දෙපාර්තමේන්තුව විසින් වෙන්කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත නාවික හමුදාවෙන් ලබා ගන්නා ලද ඉන්ධන වල වටිනාකම නැවත නාවික හමුදාව වෙත ප්‍රතිපූර්ණය නොකරනු ලබයි. 2022 වර්ෂයේ නාවික හමුදා නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ පැවැත්වූ සාකච්ඡාවේදී රටේ ඇති ආරක්ෂක සීමාවන්ට යටත්ව ප්‍රතිපූර්ණය කිරීමකින් තොරව නාවික හමුදාව මඟින් ඉන්ධන | වියදම් නිසි පරිදි පුරෝකථනය කර වැය විෂයයට අවශ්‍යය ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| කර ගැනීමකින් තොරව නාවික හමුදාවෙන් ලබා ගන්නා බැවින් දෙපාර්තමේන්තුවේ අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | ලබා දීමට අනුමැතිය ආරක්‍ෂක අමාත්‍යාංශ ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ ලිපිය මගින් ශ්‍රී ලංකා වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| | ----------------------- | ------------------------------------ | ---------------------------- | ---------------------- |
| (අ) | 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු පනත | | | |
| | (i) III වන කොටසේ 11 වගන්තිය | නිල බලයෙන් පත්වන සාමාජිකයින් 09 දෙනෙකුගෙන් යුතු උපදේශක සභාවක් ස්ථාපිත කළ යුතු වුවද, මේ දක්වාම එම සභාව ස්ථාපිත කර නොතිබුණි. | උපදේශක සභාවක් පත් කිරීම සඳහා ආරක්‍ෂක අමාත්‍යාංශය වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත. | නිල සාමාජිකයින්ගෙන් සමන්විත උපදේශක සභාවක් ස්ථාපිත කළ යුතුය. |
| | (ii) III වන කොටසේ 12 වන වගන්තිය | උපදේශක සභාව විසින් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කටයුතු පිළිබඳ සමාලෝචනයක් සිදුකර අමාත්‍යවරයා වෙත ඒ පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කිරීමට ද, දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කල යුතු ප්‍රතිපත්ති පිළිබඳ අමාත්‍යවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීමට සහ ආරක්ෂක විෂය භාර අමාත්‍යවරයාට යම් කරුණක් පිළිබඳව උපදෙස් ලබාදීමට ද උපදේශක සභාව ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් නොහැකි වී තිබුණි. | අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද ලිපිය සඳහා පිළිතුරක් බලාපොරොත්තුවෙන් සිටින බැවින් සමාලෝචිත වාර්තාවක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇත. | නිල සාමාජිකයින්ගෙන් සමන්විත උපදේශක සභාවක් ස්ථාපිත කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ), 4.2.2 (අ) හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 04 (13) වගන්තිය. | ප්‍රසම්පාදනය ආරම්භක අවස්ථාවේ සිට අවසාන අවස්ථාව දක්වා වූ ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ලේඛනයක් පිළියෙල කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂය ආවරණය වන පරිදි ප්‍රසම්පාදන අවස්ථාව දක්වා වූ ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ලේඛණයක් (PTS) පිළියෙල කිරීමට සටහන් කර ගන්නා ලදි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 14 කදී අත්අඩංගුවට ගෙන තිබූණු තහනම් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 330 ක් හා මත්පෙති 1300 ක් ශ්‍රී ලංකා පොලීසිය වෙත භාරදී තිබුණි. එසේ අත්අඩංගුවට ගන්නා ලද තහනම් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 127 ක සහ මත්පෙතිවල වටිනාකම රු. 677,770 කට තක්සේරු කර තිබුණද, අවස්ථා 02 කදී අත්අඩංගුවට ගන්නා ලද ග්‍රෑම් 203 ක් වූ තහනම් මත්ද්‍රව්‍යවල වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | කෙටුම්පත් වර්තාවේ සඳහන් කරුණු නිවැරදි බව සනාථ කරන අතර, අවස්ථා දෙකකට අදාල තක්සේරු වටිනාකම ලබාගැනීමට අපොහොසත් වී ඇති බැවින් ඉදිරිපත් කර නොමැත. | තහනම් මත්ද්‍රව්‍ය වල වටිනාකම තක්සේරුකර පොලිසියට බාර දීමට කටයුතු කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු. 283,829,893 ක් වූ නෞකා හා යාත්‍රා 07 ක් මාස 03 ක සිට අවුරුදු 3 ක් දක්වාවූ කාලයක සිට අක්‍රියව පැවතුණද, ප්‍රතිපාදන නොපැවතීම මත ඒවා අළුත්වැඩියා කර සේවයේ යෙදවීමට නොහැකි වී තිබුණි. | අක්‍රිය වී ඇති යාත්‍රා 07 අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස් ඇණවුම් කිරීමට කටයුතු කර ඇති නමුත් ප්‍රතිපාදන නොමැති විම හේතුවෙන් අළුත්වැඩියා කර සේවයේ යෙදවිමට නොහැකිවී ඇත. | යාත්‍රා අළුත්වැඩියා කිරීමට ප්‍රමුඛතාවය ලබා දිය යුතු අතර එම යාත්‍රා සේවයේ යෙදවීමට කටයුතු කල යුතුවේ. |